**ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය කළ මතය**

---

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.1 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට හා තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර , මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ දුස්සන්ධානය , ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ)ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් සහ තැන්පතු ගෙවීම් රු.1,725,425 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | එකඟ වන බව |

### 1.6.2 වාණිජ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික නිවැරදි ක්ෂය ප්‍රතිශතය යොදා නොගැනීම නිසා වාහන ක්ෂය වියදම් රු.1,404,310 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | එකඟ වන බව |
| (ආ) | පොත් අපහරණයෙන් ලැබුණු හා වෙනත් ලැබීම් රු.4,392,207 ක් සමාලෝචිත වර්ෂයේදී පොත් අලෙවි ආදායම තුළ ඇතුලත්ව තිබුණි. | විකුණුම් ආදායම නිවැරදිව හඳුනාගත යුතුය. | එකඟ වන බව |

| | | |
|---|---|---|
| (ඇ) ඉඩම් සහ ගොඩනැගිලි වෙන්වෙන්ව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් රු.11,709,740 ක් වටිනා ඉඩම් සඳහා ද රු.1,170,974 ක ක්ෂය කිරීම් සිදු කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | එකඟ වන බව |
| (ඈ) නිරවුල් කර තිබුණු රු.38,400,000 ක මුද්‍රණ ණය හිමි ශේෂයන් 2019 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂයන් තුළ ඇතුළත් කර තිබුණු අතර නිරවුල් නොවු රු.59,884,000 ක් ණය හිමි ශේෂයන් ඇතුලත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | එකඟ වන බව |
| (ඉ) රු.50,000 ක ණය හිමි ශේෂයක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | එකඟ වන බව |
| (ඊ) 2009 වර්ෂයේ සිට මුද්‍රණ ගාස්තු වෙනුවෙන් පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.7,431,012 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කල යුතුය. | එකඟ වන බව |
| (උ) පිටු අඩු වීම වෙනුවෙන් මුද්‍රණ කරුවන්ට ගෙවන ලද රු.1,334,503 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | එකඟ වන බව |
| (ඌ) අනුමත අත්තිකාරම් ගිණුමේ ශුද්ධ ලාභය ලෙස රු.826,220,942 ක් දක්වා තිබුණ ද එය පාසල් සිසුන්ට සහ ගුරුවරුන්ට පෙළ පොත් හා ගුරුමාර්ගෝපදේශ නොමිලේ බෙදාහැරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙන් කල ප්‍රතිපාදන වු රු.4,598,736,566 ක මුදල ගිණුම් වල වියදම් ලෙස හා විකුණුම් ආදායම ලෙස සටහන් කිරීමෙන් ඇති වු ශුද්ධ ලාභයක් බව නිරීක්ෂණය විය. | ශුද්ධ ලාභය නිවැරදිව හඳුනාගත යුතුය. | එකඟ වන බව |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල මාස 06 ක් ඉක්මවූ රු 4,887,869 ක් වූ චෙක්පත් 629 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | එකඟ වන බව |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන නිශ්චිත සැලැස්මක් අනුව වාර්ෂික ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා වැය විෂයයන් 02 කට අදාලව සියයට 21 ක් සහ සියයට 57 ක් ලෙස රු.8,755,596 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු සකස් කල යුතුය. | එකඟ වන බව |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ තහනමට ලක් වූ නිලධාරින්ගෙන් අයවිය යුතු වසර 3 ක් ඉක්ම වූ රු.9,500 ක ණය ශේෂය අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | එකඟ වන බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවය හැර ගිය නිලධාරින්ගෙන් රු. 524,692 ක් අයවිය යුතුව පැවති අතර වසර 05 ඉක්ම වූ රු.459,892 ක් එහි ඇතුලත් වී තිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය | එකඟ වන බව |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දූර්වලතා**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාවිතයට නුසුදුසු වටිනාකම හඳුනා ගත නොහැකි අතිරේක පොත් 79,505 ක් හා රු.31,515,577 ක අතිරේක පොත් 237,846 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | අතිරේක පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුද්‍රණය කිරීමට කටයුතු කල යුතු අතර භාවිතයට නුසුදුසු පොත් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | විකිණීමට සුදුසු හා නුසුදුසු පොත් පිළිබඳ දෙපාර්තමේන්තු කමිටුවක් මගින් වාර්තාවක් ලබා ගන්නා බවත් ඒ අනුව මෙම පොත් සම්බන්ධව තීරණයක් ගන්නා බව. |
| (ආ) | විෂය නිර්දේශය වෙනස් වී ඇති රු.2,590,780 ක් වටිනා ගුරු අත්පොත් 12,609 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ අපහරණය කර තිබුණි. | ගුරුඅත් පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුද්‍රණය කිරීමට කටයුතු කල යුතුය. | වසර කිහිපයක අවශ්‍යතාවය සඳහා එකවර මුද්‍රණය කිරීම සහ විෂය නිර්දේශ වෙනස් කිරීම හේතුවෙන් මෙම පොත් අපහරණය කිරීමට සිදු වූ බව |
| (ඇ) | 2020 වර්ෂය සඳහා පෙළ පොත් බෙදාහැරීමේ කටයුතු සියයට 99 ක් පමණ අවසන් කර තිබුණ ද අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන පොත් මුද්‍රණය කිරීම හේතුවෙන් පෙළ පොත් වර්ග 439 කට අයත් රු. 1,388,025,219 ක් වටිනා පෙළ පොත් 7,683,625 ක තොග ශේෂයක් 2020 ජනවාරි 15 දින වන විට ගබඩාවේ ඉතිරි වී තිබුණි. | නිවැරදිව පෙළ පොත් අවශ්‍යතාවය තීරණය කළ යුතුය. | ඉදිරි වර්ෂයේදී පෙළ පොත් මුද්‍රණ අවශ්‍යතාවය ගණනය කිරීමේදී පදනම් කරගත යුතු නිර්ණායකයන් ඇතුළත් කර නව සැලැස්මක් සකස් කර ඇති බවත් ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 11 වසර හින්දු ධර්මය පෙළ පොත දෝෂ සහිත වීම නිසා 2019 වර්ෂයේදී මෙම පොත නැවත මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබුණු අතර රු.2,326,740 ක් වටිනා දෝෂ සහගත පෙළ පොත් 8,945 ක් සිසුන්ගේ භාවිතයෙන් ඉවත් කර තිබුණි. | පෙළ පොත් සකස් කිරීමේදී හැකිතාක් දෝෂ අවම වන පරිදි සකස් කල යුතුය. | මෙම පොතෙහි ගැටළු නිසා භාවිතයෙන් ඉවත් කිරීමට සිදු වූ බව. |
| (ඉ) | නියැදි පරීක්ෂාවට අනුව 2020 වර්ෂයට අදාල පෙළ පොත් සඳහා ගෙවීම් කිරීමේදී පිටු අඩු හා වැඩි වීම් සඳහා පිළිවෙලින් රු.1,475,479 ක් වැඩියෙන්ද රු. 1,375,890 ක් අඩුවෙන් ද ගෙවා තිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මුද්‍රණ කරුවන්ට ලකුණු ලබා දීමේදී ගුණාත්මක පොත් ලබා දීමේ පසුගිය කාර්යසාධනය සලකා බැලිය යුතුය. | පෙළ පොත් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ ආයතන වෙත ලබා දීමෙන් පසු පිටු අඩු වැඩි වීම තාක්ෂණික හේතු නිසා සිදුවන බව. |
| (ඊ) | පෙළ පොත්වල ඇතුලත කඩදාසියේ සහ පිටකවරයේ ගුණාත්මකභාවය අඩු වීම හේතුවෙන් පිටපත් 2,678,000 ක් සඳහා රු. 1,099,282 ක් දඩ මුදල් ලෙස අයකර තිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මුද්‍රණ කරුවන්ට ලකුණු ලබා දීමේදී ගුණාත්මක පොත් ලබා දීමේ පසුගිය කාර්යසාධනය පිළිබඳ සලකා බැලිය යුතුය. | මුද්‍රණ කඩදාසි වල ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා මුද්‍රණ ආයතන කඩදාසි ආනයනයේදී ලබා ගන්නා **SGS** සහතිකය ලබා ගැනීමට කටයුතු කරන බව. |
| (උ) | සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වල මුද්‍රණ ඇණවුම් ලබා දුන් ගිවිසුම්ගත මුදල රු.49,353,217 ක් වූ ගුරු මාර්ගෝපදේශ 54 ක් සහ අතිරේක පොත් වර්ග 30 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුද්‍රණය කර භාර දී නොතිබුණි. | නියමිත කාල වකවානු තුල මුද්‍රණය කරගැනීමට කටයුතු කල යුතුය. | අතිරේක පොත් සකස් කිරීම ආරම්භයේ සිට මුද්‍රිත පොත් ගබඩාවට ලැබීම දක්වා සියළු පියවර සඳහා කාලවකවානු සහිත සැලැස්මක් සකස් කරන බවත් ගුරුඅත් පොත් සකස් කිරීමේ ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සාකච්ජා කර සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරන බව. |